# අභ්‍යන්තර සටහන

## පළාත් මහ රෝහල - බදුල්ල

| | |
|---|---|
| දිනය | 2022-09-21 |
| වෙත | සියළුම අංශ ප්‍රධානීන් වෙත |
| වෙතින් | අධ්‍යක්ෂ |
| පිටපත් | ගණකාධිකාරි/අතිකාල විෂය භාර නිලධාරින්/ AA විෂය භාර නිලධාරි |
| විෂයය | අතිකාල වවුචර්පත් නියමිත දිනයට ඉදිරිපත් කිරීම |
| ගොනු අංකය | BD/PGH/CPHMA/1/2013 |

ඔබගේ ඒකකයන්ට අදාල අතිකාල වවුචර්පත් ඉදිරිපත් කිරීමේදී පහත කරුණු පිළිබඳව අංශ ප්‍රධානීන් ලෙස ඔබගේ අවධානය යොමුකරන ලෙස මෙයින් දන්වා සිටිමි.

02. සෑම මසකම සේවා චක්‍ර ඉදිරිපත් කිරීමේදී ඉදිරි මාසයට අදාල සේවා චක්‍රය පවත්නා මාසයෙහි අවසන් සතිය තුලදී ඔබගේ නිර්දේශ සහිතව මාගේ අනුමැතියට ඉදිරිපත් කල යුතුය. අනුමත කරන ලද සේවා චක්‍රය සෑම මසකම මුල් සතිය තුල අතිකාල අංශයෙහි විෂයභාර නිලධාරි වෙත භාරදිය යුතු අතර සෑම ඒකකයක් තුලම එහි පිටපතක් තබා ගත යුතුය. අනුමත සේවා චක්‍රයෙහි සිදුකරන සියලුම සංශෝධන (සේවා මුර මාරු කිරීම්) ඔබගේ නිර්දේශ සහිතව මා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය.

03. සියලුම අනුමත සංශෝධන සහිත සේවා චක්‍ර මෙන්ම නිවැරදි ලෙස සම්පූර්ණ කර පැමිණිම/ පිටවීම පරීක්ෂා කරන ලද අතිකාල වවුචර්පත් සෑම මසකම 04 වන දිනට පෙර අතිකාල අංශය වෙත ලැබීමට සැලැස්විය යුතුය. අංශ ප්‍රධානියකු නොමැති සේවා ස්ථාන වල නිලධාරින් හා ප්‍රධාන කාර්යාලයේ පැමිණිමේ ලේඛන වල අත්සන් තබන සියලුම නිළධාරින්ගේ අතිකාල වවුචර් පත් සෑම මසකම 04 වන දිනට පෙර පාලන අංශයේ AA විෂය භාර නිළධාරි වෙත භාර දිය යුතුය.සෑම මසකම 10 වන දිනට ප්‍රථම එම වවුචර් පත්වල පැමිණිම/පිටවීම පරික්ෂා කර බලා AA විෂය භාර නිළධාරි විසින් සියලුම වවුචර් පත් අතිකාල අංශය වෙත අනිවාර්යෙන් භාර දිය යුතුය.

04. වැටුප් අංශය මඟින් සෑම මසකම 17 දිනට පෙර අමාත්‍යාංශය වෙත එම මාසයට අතිකාල ගෙවීමට අවශ්‍ය වන මුදල් ප්‍රමාණයන් පිළිබද සවිස්තරාත්මක වාර්තාවක් යැවීමට අවශ්‍ය බැවින්, අතිකාල අංශය මගින් 15 වන දිනට පෙර අතිකාල සාරාංශයන් වැටුප් අංශය වෙත භාර දිය යුතුය. එලෙස මුදල් ප්‍රමාණයන් ගණනය කිරීමේදී ප්‍රමාද වී ඉදිරිපත් කරනු ලබන වවුචර්පත් සඳහා මුදල් වෙන් කිරීමක් සිදු නොවන බව අංශ ප්‍රධානීන් වෙත දන්වා සිටිමි.

05. ඉහත පරිදි සේවා චක්‍ර හා අතිකාල වවුචර්පත් නියමිත දිනයට ඉදිරිපත් නොකරන්නේ නම්, අතිකාල ගෙවීම් කිරීමේදී ගැටලු මතුවිය හැකි බවත්, එහි වගකීම නියමිත දිනට වවුචර් පත් ඉදිරිපත් නොකරන නිළධාරින් හා අදාල අංශ ප්‍රධානීන් විසින් දැරීමට සිදුවන බවත් මෙයින් තවදුරටත් දන්වා සිටිමි.

Director
Provincial General Hospital
Badulla.